# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2026 අංක 2 දරන විශ්වවිද්‍යාල
# (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2026 පෙබරවාරි මස 03 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2026 පෙබරවාරි මස 06 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2026 අංක 2 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2026 පෙබරවාරි මස 03 වන දින]

එල්.ඩී.- ඕ 34/2025

## 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2026 අංක 2 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- 1978 අංක 16 දරන පනතේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තිය, ඒ උපවගන්තියේ (අ) ඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්;

(ආ) නැවත අක්ෂර යොදන ලද (අ) ඡේදයේ "යම් පීඨයක් යම් අධ්‍යයන අංශවලින්" යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"පීඨ මණ්ඩලය විසින් පීඨයක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ආශ්‍රිත මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් (I වන ශ්‍රේණිය) අතුරෙන් පීඨාධිපතිවරයා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය."; සහ

(2) (1) වන උපවගන්තියේ නැවත අක්ෂර යොදන ලද (අ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

PL 15568 - 768 (2025/12)

"(ආ) යම් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (I වන ශ්‍රේණිය), (අ) ඡේදය යටතේ පීඨයේ පීඨාධිපති ලෙස තෝරා පත් කර ගනු ලැබූ විට සහ එසේ තෝරා පත් කර ගනු ලබන අවස්ථාවේ දී එම පීඨයේ අධ්‍යයන අංශයක ප්‍රධාන ධුරය දරන විට, පීඨයේ පීඨාධිපතිවරයා ලෙස තෝරා පත් කර ගැනීමෙන් පසුව ඒ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා, මහාචාර්යවරයා, ආශ්‍රිත මහාචාර්යවරයා හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා (I වන ශ්‍රේණිය) එම අධ්‍යයන අංශයේ ප්‍රධානයා ලෙස ධුර දැරීම අවසන් විය යුතු ය.";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස," යන වචන වෙනුවට "කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි නිසි කාර්යපටිපාටියට අනුකූලව පාලක සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස," යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "ඒ පීඨයේ යම් අංශයක වෙනත් ප්‍රධානයකු" යන වචන වෙනුවට "ඒ පීඨයේ වෙනත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (I වන ශ්‍රේණිය)" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(5) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(4) පීඨයක පීඨාධිපති ලෙස කිසිදු තැනැත්තකු ධුර කාලසීමා දෙකකට වඩා වැඩි කාලසීමාවක් සඳහා තෝරා පත් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) (අ) උපකුලපතිවරයාගේ නිර්දේශය මත පාලක සභාව විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු අධ්‍යයන අංශයක ප්‍රධානයා විය යුතු ය.

(ආ) ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු නොමැති අවස්ථාවක දී උපකුලපතිවරයාගේ නිර්දේශය මත පාලක සභාව විසින් පිළිවෙළින් අධ්‍යයන අංශයක ප්‍රධානයා ලෙස, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (I වන ශ්‍රේණිය) හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (II වන ශ්‍රේණිය) පත් කරනු ලැබිය යුතු ය.

(ඇ) (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් එවැනි යම් පත්වීමක් සිදු කිරීමට පෙරාතු ව, ඒ පත්වීමට අදාළව තෝරා ගනු ලැබූ පුද්ගලයාගේ කැමැත්ත ලබා ගත යුතු ය.";

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) (අ) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, ස්වකීය අදාළ ධුරයෙහි ස්ථිර කොට ඇති යම් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (I වන ශ්‍රේණිය) හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (II වන ශ්‍රේණිය), අධ්‍යයන අංශයේ ප්‍රධානයා ලෙස පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.

(ආ) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා අධ්‍යයන අංශයක ප්‍රධානයා ලෙස පත් කරනු ලැබීමට සුදුසුකම් ඇති ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (I වන ශ්‍රේණිය) හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (II වන ශ්‍රේණිය) නොමැති අවස්ථාවක දී, සනාතන සභාව විසින් තීරණය කරනු ලබන එම පීඨයේ ම වෙනත් අධ්‍යයන අංශයක අදාළ විෂය ක්ෂේත්‍රයක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (I වන ශ්‍රේණිය) එකී තත්ත්වයෙන් පත් කරනු ලැබිය යුතු අතර එවැනි අවස්ථාවක දී එසේ පත්කිරීම පිළිබඳ ව පැහැදිලි කිරීමක් උපකුලපතිවරයා විසින් පාලක සභාවට සිදු කළ යුතු ය.'';

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ ''ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස,'' යන වචන වෙනුවට ''කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි නිසි කාර්යපටිපාටියට අනුකූලව පාලක සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස,'' යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''උපකුලපතිවරයා විසින් ඒ අංශයේ වෙනත් මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු හෝ කථිකාචාර්යවරයකු'' යන වචන වෙනුවට ''පාලක සභාව විසින්, උපකුලපතිවරයාගේ නිර්දේශය මත ඒ අංශයේ වෙනත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු (I වන ශ්‍රේණිය)'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(5) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(4) යම් තැනැත්තකු එකම අධ්‍යයන අංශයක ප්‍රධානයා ලෙස එක් ධුර කාලයකට වඩා වැඩි කාලසීමාවක් සඳහා පත් කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, ඉහත විධිවිධානවලට අනුකූලව අධ්‍යයන අංශයක සිටින සියලුම සුදුසුකම්ලත් තැනැත්තන් එම අධ්‍යයන අංශයේ ප්‍රධානයා ලෙස ඔවුන්ගේ ධුර කාල සම්පූර්ණ කර ඇති අවස්ථාවක දී, සහ එවැනි පත්වීමක් සඳහා සුදුසුකම්ලත් වෙනත් තැනැත්තන් නොමැති අවස්ථාවක දී, එම අධ්‍යයන අංශයේ ප්‍රධානයා ලෙස කලින් ධුරය දැරූ තැනැත්තකු, ඒ තැනැත්තාගේ කැමැත්ත ඇති ව, එම අධ්‍යයන අංශයේ ප්‍රධාන ධුරයට නැවත පත් කරනු ලැබිය හැකි ය. ඒ නැවත පත් කිරීම (1අ) උපවගන්තියේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව සිදු කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, යම් තැනැත්තකු අනුගාමී වාර දෙකකට වඩා වැඩි වාර ගණනක් අධ්‍යයන අංශයක ප්‍රධාන ධුරය දරනු නොලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.